


# අමුතු කුරුල්ලෙක් ඇවිත්

A. A. Milne ගේ කෙටි කතාවකි
පරිවර්තනය ජගත් ජේ. එදිරිසිංහ

කුරුල්ලන් ගැන මා දන්නා උලව්වක් නැත. එනමුදු එක්තරා දවසක මම කුරුළු විද්‍යාඥයකු බවට පත් කරනු ලැබුවෙමි. එය සිදුවූයේ මෙසේ ය.

එක්තරා දවසක හැම්ප්ෂයර්හිදී අපට වුකෝ කුරුල්ලා ගේ නාදය ඇසුනි. (පසුවදා උදෑසන පුවත්පත් වල පළ වූයේ ඩෙවොන්ෂයර් හි දී චුකෝ කරුල්ලා ගේ නාදය ඇසුණ බවයි. සමහර විට ඌ වෙන එකෙක් වෙන්නැති. හැබැයි කොහෙත්තම අපේ කුරුල්ලා තරම් ඉහළ මට්ටමේ එකෙක් නම් වෙන්නට ඉඩක් නැත)

"ඇහුනද චුකෝ නාදය...?" නිවහනේ සිටි සැමදෙනාම සෑම කෙනෙකුගෙන්ම කොයිතරම් වාර ගණනක් ඇසුවාද යත් අන්තිමේ මට ඒ ප්‍රශ්ණය පවා එපා විය.

බොහෝ වතාවක් "ඇහුණා" යි උත්තර දීමෙන් මා කොයිතරම් වෙහෙසට පත්ව සිටියාද කිවහොත් මේ සංවාදය තවත් රසවත් කිරීමේ අදහස පවා මගේ සිතෙන් ඈත් විය.

"ඒත් මට තවම පුම්බපු පිපිටි කුරුල්ලගෙ සද්දෙ නම් ඇහුණෙ නැහැ.... මේ අවුරුද්දේ ඌ මේ තරම් පමා වීම නම් පුදුමයි.." දහවන වතාවටත් "ඇහුණා" යි කියන්නට සිදුවීමෙන් පසුව මම බොහෝ සැහැල්ලුවෙන් කීවෙමි.

"පුම්බපු පිපිටි.. ඌත් කැළෑ පිපිටි වගේම කුරුල්ලෙක්ද...?" නිවැසි කාන්තාව ඇසුවා ය. ඈ මා හිතා හිටියාට වඩා කුරුල්ලන් ගැන දන්නා හැඩයි.

"අපොයි නැහැ.." මම විගසින් කීවෙමි.

"මොකක්ද හරියටම වෙනස..?"

"වෙනස නේද...? මෙහෙමයි.... එකෙක් පුම්බපු එකෙක්.. අනෙකා.. අම්... අනෙකා නිකම්ම කැලෑවෙ ඉන්න එකෙක්.."

"ඕ.. මට තේරුණා.."

"ඇත්තටම උන් දෙගොල්ලන්ගෙම බිත්තර වල පුල්ලි තියෙනවා" මම විශ්වාසය ඉහළ නංවා ගනිමින් කීවෙමි.

"මම හැම තිස්සෙම හිතන්නෙ කුරුල්ලන් ගැන මෙයිට වඩා දැන හිටියානම් හොඳයි කියලයි." ඈ ස්තුති පූර්වකව කීවා ය. "...දැන් ඔයාට පුළුවන් අපට උන් ගැන ටිකක් කියා දෙන්න'"

ඉඳලා හමාරයි... කරුමක්කාර කුරුල්ලෙක් කළ දෙයක තරම...

"ඇත්ත වශයෙන්ම.." ලන්ඩනයේ සිට කුරුල්ලන් ගැන් ලියැවුණ පොතක් ගෙන්වා ගන්නට කොයි තරම් කාලයක් ගත වේ දැයි කල්පනා කරන අතර වාරයේ මම කීවෙමි.

කුරුල්ලන් ගැන කතා කිරීම මා හිතූ තරම් අපහසු වූයේ නැත. අපි ගෘහෝද්‍යානයට වී සවස තේ පානය කරමින් සිටියෙමු. හදිසියේ මා කිසිදා නොදත් වර්ගයක කුරුල්ලෙක් කෑගැසුවේය.

"අන්න..., නිවැසි කාන්තාව කීවාය ,... ඇහුනද..? ඒ මොකෙක්ද..?"

මම හිස හරවා ඇහුම් කන් දුන්නෙමි. කුරුල්ලා නැවත කෑගැසුවේය.

"ඒ ලෙසර් බන්ටින් කුරුල්ලෙක්.." මම විශ්වාසයෙන් කීවෙමි.

"ලෙසර් බන්ටින්...?" සැම දෙයටම උනන්දු වන පෙනුමක් ඇති තරුණිය කෑගැසුවා ය. "... මම කොහොම හරි ඒ නම මතක තියාගන්න ඕනෙ."

"මොන පිස්සුද..?" මම සිතුවෙමි.

කුරුල්ලා නැවත කෑගැසුවේය. මේ වතාවේදී ආරක්ෂාකාරී ප්‍රහාරයක් එල්ල කරන්නට මම පරිස්සම් වූයෙමි.

"සමහර විට ඒකා සුදු බෙල්ල තියෙන සාඩිනියන් කුරුල්ලා වෙන්න බැරිත් නැහැ..." මම කීවෙමි ".... බිත්තර දාන කාලෙට මේ ජාති දෙකමට තියෙන්නෙ එක වගේ නාදයක් ... නමුත් ඇත්ත වශයෙන්ම උන් දෙගොල්ලන්ගේම බිත්තර වල පුල්ලි තියෙනවා." මම පහසුවෙන් එක් කළෙමි.

මුළු සවස් යාමයම මේ ආකාරය ගත්තේය. කුරුල්ලන් ගැන කතා කිරීම කොයි තරම් පහසු කාරියක් දැයි දැන් ඔබටම වැටහෙනවා ඇති.

කෙසේ වුවද වඩාත් අවාසනාවන්ත සිදුවීම සිදුවූයේ පසුදා සවස් කාලයේදී ය. නියම කුරුළු විශේෂඥයෙක් එදා සවස තේ පානයට ආවේය.

ඔහුගේ පැමිණීම කන වැකුණ වහාම කුරුළු විශේෂඥයා නිරුපද්‍රිතව පිටත් කර හරින තෙක් සකල ලෝක වාසී සියළුම කුරුල්ලන් නිහඬ කර දෙන්නැයි මම දෙවියන්ගෙන් ඉල්ලා යාඥා කළෙමි. උන් වහන්සේ මගේ යාඥාවට කන් දුන්නේ නැත.

අපේ පිහාටුකාරයා තුරු අතර සිට සිය නාදය නැගුවේ ය.

"අන්න..." නිවැසි කාන්තාව කීවා ය. "...ඇහුනද..? අන්න අර කුරුල්ලා ආයෙමත් කෑගහනවා.." ඈ මා දෙසට හැරුණාය. "...මොකක්ද ඔබ ඌට කීව නම..?"

කුරුළු විශේෂඥයා පළමුව කතා කරනු ඇතැයි මම බලාපොරොත්තු වූයෙමි. එසේ වූවා නම් ඊයේ මා කියූ කාරණා මේ පිරිස වරදවා වටහාගෙන ඇතැයි කියා ගැලවෙන්නට මට ඉඩ තිබුණි. එහෙත් අවාසනාවට ඒ මො-හොතේ කුරුළු විශේෂඥයා බරපතල සැන්ඩ්විච් පෙත්තක් මහත් ඕනෑකමින් ගිල දමමින් සිටියේ ය.

සියල්ල කෙසේ හෝ මතක තබාගන්නෙමැයි පොරොන්දු වූ අවංක පෙනුමැති තරුණිය වැරදීමකින් හෝ යමක් කියතැයි බලාපොරොත්තුවෙන්

1882 දී ලන්ඩනයේදී උපත ලබා 1956 දී මියගිය Alan Alexander Milne, අතිශය ජනප්‍රිය ,විනී ද පූ, ළමා පොත් පෙළේ රචකයායි. ඔහුගේ බොහෝ නිර්මාණ නාට්‍ය වන අතර ඔහු සහකාර සංස්කාරවරයකු ලෙස කටයුතු කළ පන්ච් සඟරාවේ ඔහුගේ නිර්මාණ පළවිය. ඔහුගේ කෘති තුල දැකිය හැකි විශේෂිත ලක්ෂණය උපහාසයයි.

මම ඇය දෙස බලා සිටියෙමි.. මගේම අවාසනාව. ඇයද නිෂ්ශබ්දය. අර කාලකණ්නි කුරුල්ලා හැරෙන්නට අන් සියල්ලන්ම නිස්ශබ්දය.

ප්‍රශ්ණයක් නැහැ. නැවත වතාවක් මගේ දෛවය උරගා බලන්නට මම උත්සාහ කරන්නෙමි.

"ඒකා බ්ලැක්මන්ස් වෝබ්ලර් " මම සිථිර හඬින් කීවෙමි.

"අන්න හරි" නිවැසි කාන්තාව කීවා ය

"බ්ලැක්මන්ස් වොබ්ලර්.. මට ඒක අමතක වෙන්නෙ නැහැ" උනන්දු තරුණිය කීවාය.

සැවිඩ්විචය සමග හරඹය හමාර කර සිටි කුරුළු විශේෂඥයා මා දෙසට කෝප සහගත බැල්මක් හෙළුවේ ය.

"විකාර...." ඔහු කීවේ ය. ".. ඌ චිෆ් චැෆ්"

අනෙක් සියල්ලෝ නින්දා සහගත බැල්මක් මදෙස හෙළුවෝ ය.

"චිෆ් චැෆ්ට සොමර්සෙට් හි අපේ පළාතේ කියන නම බ්ලැක්මන්ස් වෝබ්ලර් තමයි" යනුවෙන් කියන්නට මා සූදානම් වන මොහොතේම කුරුළු විශේෂඥයා නැවත කතා කළේ ය.

"ඌ චිෆ් චැෆ් ම තමයි." ඔහු අපේ නිවැසි කාන්තාවට කීවේ නොඉවසිය හැකි දැණුමක් ප්‍රදර්ශණය කරමිනි.

මෙය ඉවසා සිටින්ට නොහැකිය.

"මමත් මුළින්ම උගෙ සද්දෙ අහපු වෙලාවෙ හිතුවෙ එහෙම තමයි...." ඔහුට ආචාරසම්පන්න සිනහවක් පාමින් මම කීවෙමි.

දැන් නින්දා සහගත බැල්මක් හෙළීමේ කුරුළු විශේෂඥයා ගේ වාරයයි. "ඒ සද්ද දෙකම ඒක වගේමද..?" මගේ නිවැසි කාන්තාව වඩා

15 වන පිටුවට